කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක :- 04/2014

මගේ අංකය :-DMS/cir/04/2014

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

කොළඹ 01

2014.09.25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය බැංකු සහ

සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා දිරි දීමනා ගෙවීම**

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවය සඳහා මෙන්ම, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සඳහාද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2013.06.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයට 2013.07.01 දින හෝ ඊට පසුව බඳවා ගනු ලබන සියලුම නිලධරයන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් එකී තනතුරට අදාළව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට වසර පහක් (05) තුළ හෝ සේවයට බැඳී වසර පහක්(05) තුළ හෝ ලබා ගත යුතු ය.

03. තනතුරුවලට පැවරෙන කාර්යභාරය අනුව අවශ්‍ය වන අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම කාණ්ඩ හතරකින් සමන්විත වේ. එම ප්‍රවීණතා මට්ටම ළඟාකර ගැනීම සඳහා සමත්විය යුතු පරීක්ෂණ හා දිරි දීමනා පිළිබඳ විස්තර පහත වගුව මඟින් දක්වා ඇත.

| ප්‍රවීණතා මට්ටම | වැටුප් කාණ්ඩය (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව) | සමත් විය යුතු පරීක්ෂණය | ගෙවනු ලබන දිරි දීමනාව* |
|---|---|---|---|
| 1 කාණ්ඩය | HM, AR 2 | 1වන ප්‍රවීණතා මට්ටමට අදාළ ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය | එක් වරක් පමණක් ගෙවනු ලබන රු.25,000/-ක දීමනාවක් හා වැටුප් වර්ධකයකට සමාන මාසික දීමනාවක් |
| 2 කාණ්ඩය | MM, AR 1 | 2වන ප්‍රවීණතා මට්ටමට අදාළ ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය | එක් වරක් පමණක් ගෙවනු ලබන රු.22,500/ක දීමනාවක් හා වැටුප් වර්ධකයකට සමාන මාසික දීමනාවක් |
| 3 කාණ්ඩය | JM, MA | 3වන ප්‍රවීණතා මට්ටමට අදාළ ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය | එක් වරක් පමණක් ගෙවනු ලබන රු.20,000/-ක දීමනාවක් හා වැටුප් වර්ධකයකට සමාන මාසික දීමනාවක් |
| 4 කාණ්ඩය | PL | 4වන ප්‍රවීණතා මට්ටමට අදාළ ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය | එක් වරක් පමණක් ගෙවනු ලබන රු.15,000/-ක දීමනාවක් හා වැටුප් වර්ධකයකට සමාන මාසික දීමනාවක් |

*මෙම දිරිදීමනාව යටතේ සඳහන් වැටුප් වර්ධකයට සමාන මාසික දීමනාව, විශ්‍රාම වැටුප් / සේවක අර්ථ සාධක අරමුදල්/ සේවක භාරකාර අරමුදල් / විශ්‍රාම පාරිතෝෂික ගණනය කිරීම සඳහා අදාළ කර නොගත යුතුය. එසේම මෙම දීමනාව අදාළ කරගත යුත්තේ 2013.07.01 දිනට පෙර එක් එක් ආයතනවල සේවයට බඳවාගත් නිලධරයන්ට පමණි.

04. ඉහත 03 ඡේදයේ කාණ්ඩවලට අදාළව පැවැත්වෙන ලිඛිත පරීක්ෂණ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින්ද, වාචික පරීක්ෂණ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් ද වසරකට දෙවතාවක් බැගින් 2014 වර්ෂයේ සිට සෑම වසරකම පැවැත්විය යුතුය.

05. නිලධරයකු අපො.ස.(සා.පෙළ) විභාගයේදී දෙවන බස ලෙස සිංහල/ දෙමළ විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇත්නම්, ඉහත ප්‍රවීණතා මට්ටම් හතරෙහි සඳහන් ලිඛිත පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරෙනු ඇත.

06. ඉහත 3වන හා 4වන ප්‍රවීණතා මට්ටම්වලට අදාළ ලිඛිත හා වාචික පරීක්ෂණය වෙනුවට පිළිවෙලින් පැය 150ක් හා පැය 100ක් අවම වශයෙන් ආවරණය වන පරිදි, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය විසින් අනුමත විෂය නිර්දේශයට අනුකූලව පවත්වනු ලබන පාඨමාලාවක් හදාරා එය අවසානයේදී පැවැත්වෙන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත්වීම ප්‍රමාණවත් වනු ඇත.

07. නිලධරයෙකු, දැනටමත් 03 ඡේදයේ ඇතුලත් නොවන යම් භාෂා ප්‍රවීණතාවයකට අදාළ සුදුසුකමක් ලබා ඇත්නම් රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ එකඟතාවය ඇතිව ලබා ගත යුතු භාෂා ප්‍රවීණතාවයන් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැකිය.

08. මෙම චක්‍රලේඛ විධිවිධාන පරිදි, භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු නිලධරයන්, එකී නියමිත කාලය තුළ අදාළ ප්‍රවීණතාවය අත්කර ගැනීමට අපොහොසත් වන්නේ නම් අදාළ කාල සීමාව අවසන් වූ වහාම එම නිලධරයන්ගේ ඉදිරි වැටුප් වර්ධක ගෙවීම නතර කිරීමට කටයුතු කළ යුතුය. මෙම වැටුප් වර්ධක ගෙවීම නතර කිරීම, අදාළ සුදුසුකම් සපුරා ගන්නා තෙක් ක්‍රියාත්මක කළ යුතුය.

09. 2013.07.01 දිනට ප්‍රථම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයට බැඳී ඇති නිලධරයන් ස්වකීය අභිමතය පරිදි තමන් දැනට සේවයේ යෙදී සිටින සේවා මට්ටමට අදාළව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගතහොත් ඉහත අංක 03 ඡේදයෙහි සඳහන් දිරි දීමනාව ලබා ගැනීමට හිමිකම් ලැබේ. එසේ වුවද, සිංහල සහ දෙමළ භාෂා ප්‍රවීණතාවය මූලික සුදුසුකමක් ලෙස බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් කර ඇති තනතුරු සඳහා මෙම දිරි දීමනාව හිමි නොවේ.

10. එක් වරක් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන ඇති නිලධරයකුට එකම සේවා ස්ථානය තුල ශ්‍රේණිගත උසස්වීම් තුළදී අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම අවශ්‍ය නොවන අතර, එකම සේවා ස්ථානයක වුවත් වෙනත් තනතුරකට පත්වීමේදී එම තනතුරට අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

11. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳෙන නිලධරයන් පහත සඳහන් පරිදි රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතුය.

   I. එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතා මව්බස මට්ටමෙන් හා අනෙක් රාජ්‍ය භාෂාව නිලධරයා දැනට දරණ තනතුරට අදාළ දෙවන බස ප්‍රවීණතාවට අදාල මට්ටමෙන් ලබා ගත යුතු වේ.

II. තමන් මව්බස මට්ටමෙන් ප්‍රවීණතාව ලබා ගන්නේ කුමන රාජ්‍ය භාෂාවෙන්ද යන්න නිලධරයාගේ මනාපය පරිදි තීරණය කළ හැකිය. මව්බස මට්ටමේ ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර, තනතුරට අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ වන පරිදි අවුරුදු පහක්(05) තුළ ලබා ගත යුතු වේ.

III. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයකු විසින් තමන් සේවයට බැඳීමට පෙර හෝ සේවය අතරතුර දී හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍ය විෂය සමත් වී ඇත්නම්, එම රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් මව්බස මට්ටමේ ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාව නිලධාරියා විසින් සම්පූර්ණ කර ඇති බවට සැලකිය හැකිය.

IV. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයෙකුට දෙවන බස ප්‍රවීණතා මට්ටම ලබා ගැනීම සඳහා 03 ඡේදයේ විධිවිධාන අදාළ කර ගත හැකිය.

12. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයට ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් බැඳුන නිලධරයන්ට, රාජ්‍ය භාෂා දෙකෙහිම ප්‍රවීණතාව ලබාගත් පසුව මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව මව්බස නොවන අනෙක් රාජ්‍ය භාෂාව සඳහා පමණක් දීමනා ලබාගත හැකිය.

13. 2013.06.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් විද්වත් කමිටුව විසින් යෝජිත විෂය නිර්දේශ පදනම් කරගෙන එක් එක් කාණ්ඩය සඳහා පෙළ පොත් සම්පාදනය කිරීම හා ඒ අනුව, ප්‍රවීණතා මට්ටම සඳහා ගැලපෙන පුහුණු මොඩියුල සම්පාදනය කිරීම මෙන්ම එම පුහුණු මොඩියුල අන්තර් ක්‍රියාකාරී ලෙස සංයුක්ත තැටි වශයෙන් සකස් කිරීම සහ එම රාජ්‍ය භාෂා පාඨමාලා මොඩියුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා විෂය භාර අමාත්‍යාංශ විසින් පියවර ගනු ඇත.

14. ඉහත 13 ඡේදයේ සඳහන් මොඩියුල සකස් කරන තෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට වඩාත් යෝග්‍ය පොත් හඳුනා ගැනීමටත්, එම පොත්වල පරිලෝකනය(Scan) කරන ලද PDF පිටපත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙහි නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීමටත්, එම පොත්වල ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කොට ඒවා අවශ්‍ය කරනු ලබන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන්ට ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දීමටත් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් අවශ්‍ය පියවර ගනු ඇත.

15. ඉහත 03 ඡේදයේ සඳහන් කාණ්ඩ සඳහා වූ විෂය නිර්දේශ අනුව, ඒ ඒ කාණ්ඩවල ප්‍රවීණතා මට්ටමට සරිලන සේ පිළියෙල කරනු ලැබූ ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව එක්ව පිළියෙල කර රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධරයන්ගේ පරිශීලනය සඳහා ලබා දීමට පියවර ගනු ඇත.

16. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර කාර්යමණ්ඩලය හා වැටුප් ක්‍රම අනුමත කරවාගෙන නොමැති ආයතනවල නිලධාරීන් ලබාගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම් තීරණය කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පිළිබඳව වරින් වර පැන නගින ගැටළු සම්බන්ධව අවශ්‍ය තීරණ ගැනීම පිණිස පහත සඳහන් නිලධරයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබේ. තවද රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්බන්ධයෙන් දැනටමත් දිරිදීමනා ගෙවනු ලබන ආයතන වන්නේ නම් මෙම චක්‍රලේඛය ප්‍රකාරව අදාල දීමනා ගැලපුම් කිරීමටද පහත සඳහන් නිලධාරි කමිටුව වෙත ඉදිරිපත් කලයුතුය.

I. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
II. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් / ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්
III. රාජ්‍ය භාෂා කොමසාරිස්

17. මෙම චක්‍රලේඛ විධිවිධානවල නියමකර ඇති රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම අගය කිරීමක් වශයෙන් නිලධරයන් විදේශ ශිෂ්‍යත්ව, පුහුණු පාඨමාලා හෝ පශ්චාත් උපාධි සඳහා ඉල්ලුම් කරන විට, එකී රාජ්‍ය භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබා තිබෙන නිලධරයන්ට ප්‍රමුඛතාව ලබා දීමට පියවර ගත යුතුය.

18. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සියලු බඳවා ගැනීමේ පරිපාටින්හි සඳහන් අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් වූ විධිවිධාන මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සංශෝධනය වූවා සේ සලකා කටයුතු කළ යුතුය.

පී.බී ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත්-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
6. ලේකම්, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
7. විගණකාධිපති

8. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
9. ලේකම්, ජාතික වැටුප් කොමිසම
10. ලේකම්, මුදල් කොමිෂන් සභාව
11. විභාග කොමසාරිස් ජනරාල් - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
12. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
13. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
14. රාජ්‍ය භාෂා කොමසාරිස් - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
15. පොදු ගොනුව